*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2019 වර්ෂය සඳහා කෑගල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කළාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා වලින් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,121 - 2019 අප්‍රේල් මස 26 වැනි සිකුරාදා - 2019.04.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 926 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 936 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 959 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* -(i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අප්‍රේල් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

925 - B 81517— 5,403 (2019/04)

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *සේවා ගණය හා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අවම අධ්‍යාපන සුදුසුකම් වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|---|---|
| 01 | රියදුරු | ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණිය | 01 | PL-3 2016 | රු. 25,790- 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | i. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වීම ;<br>සහ<br>ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි. (අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුයි.) |
| 02 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 02 | PL-1 2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | i. 08 වැනි ශ්‍රේණිය (09 වසර) සමත්වීම |
| 03 | මුරකරු | ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය | 01 | PL-1 2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් විය යුතුයි. |

02. *වයස් සීමාව* :

i. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

ii. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. *පොදු සුදුසුකම්* :

i. අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතු අතර අයදුම්පත් කැඳවන අවසාන දිනට දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කල යුතුයි. වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

iii. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.

iv. අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

04. *පොදු කොන්දේසි* :

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

ii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මාස 03 ක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය.

ii. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීන්දුවලට ඔබ යටත් විය යුතුය. තවද ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

iii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුතු තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

iv. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද මුදල් රෙගුලාසිවලටද දෙපාර්තමේන්තු නියෝගවලටද රජය හෝ දකුණු පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව සේවය කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

i. නියමිත සුදුසුකම් සපුරන අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ ප්‍රතිඵල මත බඳවා ගැනේ.

07. *ලකුණු ලබා දීමේ ක්‍රමවේදය* :

i. ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය - අයදුම්පත් කැඳවීමෙන් පසුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.

ii. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය :

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | අ.පො.ස. සා/පෙළ සාමාර්ථය සඳහා | (8 x 1) | - | 08 |
| 1.2 | අ.පො.ස. සා/පෙළ සම්මාන සාමාර්ථ සඳහා | (8 x 2) | - | 16 (උපරිම) |
| | අ.පො.ස. උ/පෙළ සමත් වීම | | - | 04 |
| 2. | වෘත්තියට අදාළ දැනුම | | - | 10 |
| 3. | පෞරුෂත්වය | | - | 05 |
| 4. | වෘත්තියට අදාළව පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම | | - | 15 |
| | (වසරකට ලකුණු 2 බැගින්) | මුළු එකතුව | - | 50 |

සමත්වීම සඳහා 40% ක් (ලකුණු 20) හෝ ඊට වඩා ලකුණු ලබා ගත යුතුය.

iii. වෘත්තීය ප්‍රවීණතා පරීක්ෂණය

මෙහි දී වෘත්තියට අදාළ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

මුළු ලකුණු 50, සමත් වීම සඳහා 40% (ලකුණු 20) ලබා ගත යුතුය.

ii. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය -

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර සුදුසුකම් | 10 | |
| 3 | පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*සටහන* .- 1. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කෙරේ.

08. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

09. මෙම දැන්වීම් නිවේදනයේ සිංහල, දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුයි.

10. *ඉල්ලුම් කරනු ලබන ආකාරය* :

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2019.05.26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව, අගලිය, බද්දේගම", යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය :

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත
iii. අධ්‍යාපන සහතික හා පාසල් හැර යාමේ සහතිකය
iv. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් මාස 06 ක් තුළ දී නිකුත් කරන ලදුව ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය)
v. මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක්
vi. වෘත්තීය හා සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේනම්)
vii. පොලිස් සහතිකය

ලොකුගේ ගුණසිරි,
සභාපති,
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 03 වැනි දින,
වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :――――――――――

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :――――――――――

03. ස්ථිර පදිංචි ලිපිනය :――――――――――

04. දුරකථන අංකය :—————————————.

05. දිස්ත්‍රික්කය :—————————————.

06. උපන් දිනය :—————————————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :—————————————.

08. අයදුම්පත් භාර ගන්නා දිනට වයස :—————————————.

අවුරුදු:—————, මාස :—————, දින:—————.

09. ස්ත්‍රී/පුරුෂ භාවය :—————————.

10. විවාහක/අවිවාහක භාවය :—————————.

11. ජාතිය :—————————.

12. ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද?, එසේනම් පරම්පරාවෙන් ද /ලියාපදිංචි වීමෙන්ද? :—————————.

13. අධ්‍යාපන සුදුසුකම් :—————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 | | 5 | |
| 2 | | 6 | |
| 3 | | 7 | |
| 4 | | 8 | |

14. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :—————————.

15. ඔබ දැනටමත් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේනම් :
දැනට දරන තනතුර :—————————.
එම තනතුරට පත් වූ දිනය :—————————.
එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත ද) :—————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි.

මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

—————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————————.

*දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.................................................................................. මහතා/මහත්මිය/මෙනවිය දනට මෙම කාර්යාලයේ ......................................................... වශයෙන් සේවය කරයි. අයදුම්පත නිර්දේශ කර/නිර්දේශ නොකර ඉදිරිපත් කරමි.

—————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :—————————

04-830

## හබරාදූව ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

දකුණු පළාත් රාජ්‍ය සේවයේ හබරාදූව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අවම අධ්‍යාපන/ශිල්පීය නිපුණතා ප්‍රවීනතා සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | ආයුර්වේද සංයෝජක III ශ්‍රේණිය | 01 | PL2-2016 | රු. 25,250 - 10 x 270 - 10x 300 - 10 x330 - 12x 350 - රු. 38,450 | (i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුයි.<br>(ii) තුන් අවුරුදු පරිවාස කාලය තුළ අනිවාර්යයෙන්ම තනතුරට අදාලව වක්වැල්ල කළමනාකරණ හා පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන ත්‍රෛමාසික පුහුණු පාඨමාලාවක් හදාරා අදාල සහතික පත්‍රය ලබා ගත යුතුය.<br>(iii) අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 02 | PL1-2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | (i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |
| 03 | රියදුරු III ශ්‍රේණිය | 01 | 3-2016 | රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | (i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී ඕනෑම විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.<br>(ii) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් (බර වාහන සඳහා) හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. එම බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. |
| 04 | පුස්තකාල සහායක III ශ්‍රේණිය | 02 | PL-1-2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x300 - 12 x 330 - රු. 36,410 | (i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |
| 05 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | 04 | PL-1-2016 | රු. 24,250 - 10 x250 - 10 x 270 - 10 x300 - 12 x 330 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |
| 06 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 04 | PL-1-2016 | රු.24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

02. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

03. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට දකුණු පළාත තුළ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය ඇති අයකු විය යුතුය. (ඒ බවට ඡන්ද හිමි නාම ලේඛනය ආශ්‍රයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය)

(iii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතුය. (ඒ බව පොලිස් වාර්තාවක් මගින් සනාථ කළ යුතුය.)

(v) අයදුම්පත් කැඳවීම අවසන් දිනට අයදුම්කරුවන් අදාල තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය. (හබරාදුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

04. *පොදු කොන්දේසි :*

(i) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලයේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය හබරාදුව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සතුය.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් මාස 03ක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නිරතවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. වැන්දඹු/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පමණක් පරිවාස කාලය අවසානයේදී සේවය ස්ථිර කරනු ලැබේ.

06. *බඳවා ගැනීමේ කොන්දේසි :*

(i) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, මුදල් රෙගුලාසි වලට හා රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද, දකුණු පළාත් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

08. *සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දෙන ක්‍රමය :*

(i) දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ ''ප්‍රාථමික අර්ධ ශිල්පීය'' සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය''- ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් -

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3 | පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| **එකතුව** | | **100** | |

(ii) දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවක සේවයේ ''ප්‍රාථමික - ශිල්පීය නොවන'' සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් –

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර සුදුසුකම් | 10 | |
| 3 | පළපුරුද්ද | 10 | |
| 4 | සභා බල ප්‍රදේශයේ පදිංචිය | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| **එකතුව** | | **100** | |

(iii) රියදුරු :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.
මෙම සේවා ගණයට සිදුකරනු ලබන සියලුම පත්කිරීම් බඳවා ගැනීම් මෙම පටිපාටියෙහි සේවා ව්‍යවස්ථාවෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

(i) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබාදෙන ක්‍රමවේදය*

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ - සාමාන්‍ය සාමාර්ථ සඳහා | ලකුණු 8 x 1 - ලකුණු 8 |
| 2 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ - සම්මාන සාමාර්ථ සඳහා | ලකුණු 8 x 2 ලකුණු 16 (උපරිම) |
| 3 | අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත්වීම | ලකුණු 4 |
| 4 | වෘත්තියට අදාල දැනුම | ලකුණු 10 |
| 5 | පෞරුෂත්වය | ලකුණු 5 |
| 6 | වෘත්තියට අදාල පුහුණුව හෝ සේවා පළපුරුද්ද ලබා තිබීම | ලකුණු 15 (වසරකට ලකුණු 2 බැගින්) |
| මුළු එකතුව | | ලකුණු 50 |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා 50% ක් ලබාදෙනු ලබන අතර සමත් වීම සඳහා 40% ක් (ලකුණු 20 ක් හෝ ඊට වඩා) ලබාගත යුතුය.

ii. වෘත්තීය පරීක්ෂණය :

වෘත්තීය සම්මුඛ පරීක්ෂණය සඳහා 50% ක් ලබා දෙනු ලබන අතර සමත්වීම සඳහා 40% ක් (ලකුණු 20 ක් හෝ ඊට වඩා) ලබාගත යුතුය.

09. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය;
ii. අධ්‍යාපන සහතික;
iii. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්;
iv. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබාගෙන තිබිය යුතුය.);
v. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික;
vi. සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.);
vii. වලංගු රියදුරු බලපත්‍රය (රියදුරු තනතුර සඳහා අයදුම්කරන්නන් පමණි.)

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2019.05.31 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රාදේශීය සභාව, හබරාදූව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර "................................ තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත'' යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය.

උදා :- රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

(අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල ඉදිරිපත් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිළි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.
මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

10. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම ආදී බලතල හබරාදූව ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් 04 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**හබරාදුව ප්‍රාදේශීය සභාව**

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ හබරාදුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ....................................... තනතුර සඳහා බඳවාගැනීමේ අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————————————
02. මුලකුරු වලින් හැඳින්වෙන නම :————————————
03. ස්ථිර ලිපිනය :————————————
04. දිස්ත්‍රික්කය :————————————
05. උපන් දිනය : අවුරුද්ද:—————— මාසය:—————— දිනය:——————
06. ජාතික හැඳුනුම්පත් අංකය :————————————
07. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————
08. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස:
අවුරුදු:—————— මාස:—————— දින:——————
09. විවාහක/අවිවාහක බව :————————————
10. ජාතිය :————————————
11. ඔබ ශ්‍රී ලාංකිකයෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන වග :————————————
12. අධ්‍යාපන සුදුසුකම් ඃ (සමත් වූ විභාග පිළිබඳ විස්තර)
(i) සමත් වූ වසර/ශ්‍රේණිය : ——————
(ii) අ.පො.ස. (සා. පෙළ) විභාගය : ——————
විභාග අංකය : ——————
විභාග වර්ෂය හා මාසය : ——————

සමත් වූ විෂයයන් ඃ

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

(iii) අ.පො.ස. (උ. පෙළ) විභාගය :
විභාග අංකය : ——————
විභාග වර්ෂය හා මාසය : ——————

සමත් වූ විෂයයන් :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

13. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි.) :
————————————————————
————————————————————
————————————————————

14. සේවා පළපුරුද්ද :

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :
එසේනම් එම තොරතුරු :

16. ඔබ දැනටමත් මෙම ආයතනයේ ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමින් සේවය කරයි නම් එම සේවා කාලය හා විස්තර පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික)සේවා සහතිකය ඉදිරිපත් කළ යුතුය. :

17. වෙනත් සුදුසුකම් (සහතික ඇත්නම් එමගින් සනාථ කළ යුතුයි) :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා අවසන් වශයෙන් තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම් ලබා දීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහය යටතේ පත්වීම සම්බන්ධ නියමිත නීත්‍යානුකූල පියවර ගැනීමට යටත් වන බව දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :

(දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

ආයතන ප්‍රධානියාගේ සහතිකය :

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙම තනතුරට ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟවන බවත්, ඔහු/ඇය දැනට මෙම ආයතනයේ................................................. කු වශයෙන්, ස්ථිර, අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන බවත් සහතික කරමි.

,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : .

04-925

# පළාත් පාලන නිවේදන

## නොච්චියාගම ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට අදාළව විනෝද බදු ආඥාපනත

නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව පහත සඳහන්වූ යෝජනාව 2018 ජූලි මස 10 වැනි දින තීරණ අංක 54 යටතේ සම්මත කර ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි.

ආර්. බී. ගුණරත්න,
සභාපති,
නොච්චියාගම ප්‍රාදේශීය සභාව.

2018 වර්ෂයේ ජූලි මස 10 වැනි දින,
නොච්චියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

267 වන අධිකාරිය වන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ මෙම සභාව විසින් සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (විනෝද බදු ආඥාපනතේ විස්තර කොට ඇති පරිදි) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම සඳහා අය කර ගනු ලබන ගාස්තුවලින් 20%ක බද්දක් මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

04-1114

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත්, උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

### ලියාපදිංචි කළ යුතු මාර්ගය


| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (මීටර්) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | අංක - 117, කුරුකුත්තල ඉහල | තැන්න සිට පුස්සැල්ල කපුකොටුව හරහා ඉල්ලගොල්ල මාර්ගය | තැන්න | ඉල්ලගොල්ල | 1. ඒ. ඒල්. ඒ. වාහිඩ් මයා.<br>2. එම්. ආර්. එම්. අතීස් මයා<br>3. ඒ. එම්. රිෆ්කාන් මයා<br>4. ඒ. එල්. ඒ. රසාක් මයා<br>5. කේ. එම්. රියාස් මයා<br>6. යූ. ඒ. රුවයිදීන් මයා<br>7. යූ. එෆ්. මුබාරක් මයා<br>8. මොහොමඩ් ෆුවාඩ් මයා<br>9. එම්. ආර්. එම්. රියාස් මයා<br>10. මොහොමඩ් රාසික්<br>11. එම්. කේ. එම්. නසීස් මයා<br>12. ඒ. ඩබ්. සිත්ති ෆවුසියා මිය<br>13. මොහොමඩ් දුල්පි මයා<br>14. එම්. යූ. එම්. ඉල්යාස් මයා | 1. ඒ. ඒල්. ඒ. වාහිඩ් මයා.<br>2. එම්. ආර්. එම්. අතීස් මයා<br>3. එම්. එස්. ඒ. හසන් මයා<br>4. ඒ. එම්. රිෆ්කාන් මයා<br>5. ඒ. එල්. ඒ. රසාක් මයා<br>6. කේ. එම්. රියාස් මයා<br>7. යූ. ඒ. රුවයිදීන් මයා<br>8. යූ. එෆ්. මුබාරක් මයා<br>9. මොහොමඩ් ෆුවාඩ් මයා<br>10. එම්. ආර්. එම්. රියාස් මයා<br>11. මොහොමඩ් මුබාරක් මයා<br>12. එම්. කේ. එම්. නසීස් මයා<br>13. ඒ. ඩබ්. සිත්ති ෆවුසියා මිය<br>14. මොහොමඩ් දුල්පි මයා<br>15. එම්. යූ. එම්. ඉල්යාස් මයා<br>16. එෆ්. එම්. සිෆාන් මයා | 750 | 10 |

K.B.LANSAKARANAYAKE
Regd.Licensed Surveyor
215,Pilimathalawa.

PLAN NO : 9332

PUSSELLA KAPUKOTUWA VIA ILLAGOLLA ROAD
LENGTH = 345M
10ft WIDE

SCALE = 1 : 2000




Reference
G:Garden
St:Stake wooden

PLAN
of
An Allotment of Land Called
PUSSELLA KAPUKOTUWA VIA ILLAGOLLA ROAD
Situated at = Pussella,Kapukotuwa & Illagolla
G.S. = Kurukuttala
In Kandupalatha Korale of Udunuwara
A.G.A. = Udunuwara
Pradesiya Saba = Udunuwara
Kandy District
Central Province

| CONTAINING IN EXTENT | | |
|---|---|---|
| Lot No | A - R - P | (Hect:) |
| 1 | 0 - 0 - 39.51 | (0.0999) |

K. B. LANSAKARANAYAKE (F. S. I.)
Registered Licensed Surveyor
(J: P. All Island)
215, Pilimatalawa

Surveyed on = 26.02.2019

04-715

## අකුරණ ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායෙහි කාර්ය හා කර්තව්‍ය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳව සම්මත අතුරු ව්‍යවස්ථාව

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව මෙහි පහත උපලේඛනයේ සඳහන් යෝජනාව 2019.03.12 වැනි දින මහා සභා වාර්තාවේ 5.1.7 අංක දරන යෝජනා සම්මුතියක් යටතේ සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2019 මාර්තු මස 29 වැනි දින.
අකුරණ ප්‍රදේශීය සභාවේ දී ය.

***යෝජනාව***

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන උපවගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ (2) වන උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018/09/25 වැනි දින දරන 2090/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පලකරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද්දා වූ මධ්‍යම පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායෙහි කාර්ය හා කර්තව්‍ය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මෙම යෝජනාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරනු ලබන දින සිට අකුරණ ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේහීය සභා පනතේ 122(1) උප වගන්තියෙන් මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019.03.12 වන දින පැවති මහ සභා තීරණ අංක 5.1.7 යටතේ සභාව යෝජනා කරමි.

04-1115

---

## රිදීගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 7794 යටතේ සඳහන් කොට ඇති මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.


03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. විල්බට් කුලංතුග,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**කවිසිගමුව සූරිය මාවත**

| මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | අවසානය | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් | ග්‍රාම නිලධාරි වසම සහ අංකය | මාර්ග යේ දිග අඩි | මාර්ග යේ පළල අඩි | මාර්ග සිතියම අදාළ පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| කවිසිගමුව සූරිය මාවත | දැදුරු ඔය අමුණට යන මාර්ගයෙන් | ඒ. ඒ. නිශාන්ත අදත්සූරිය මහතාගේ ඉඩම දක්වා | 1. ඒ. ඒ. ගාමිණී නිමල් වික්‍රමතිලක හිමිකම් කියන ඉඩම<br>2. ඒ. ඒ. පුෂ්පා රංජනී මහත්මිය හිමිකම් කියන ඉඩම<br>3. ඒ. ඒ. ලයනල් විජේසූරිය මහතා හිමිකම් කියන ඉඩම<br>4. ඒ. ඒ. ගුණතිලක මහතා හිමිකම් කියන ඉඩම<br>5. කේ. ශ්‍රියානි බන්දුලතා මහත්මිය හිමිකම් කියන ඉඩම<br>6. ඒ. ඒ. සමන් කුමාර අදත්සූරිය මහතා හිමිකම් කියන ඉඩම<br>7. ඒ. ඒ. ශාන්ත කුමාර අදත්සූරිය මහතා හිමිකම් කියන ඉඩම<br>8. ඒ. ඒ. නිශාන්ත අදත්සූරිය මහතා හිමිකම් කියන ඉඩම | 1. ඩී. එම්. රුවන් විපුල දිසානායක මහතා හිමිකම් කියන කුඹුරු ඉඩම<br>2. ඒ. ඒ. විජේසේකර මහතා හිමිකම් කියන කුඹුරු ඉඩම<br>3. ඒ. ඒ. ශාන්ත කුමාර අදත්සූරිය මහතා හිමිකම් කියන කුඹුරු ඉඩම<br>4. ඩබ්. එම්. ටිකිරි කුමාරි මහත්මිය හිමිකම් කියන කුඹුරු ඉඩම<br>5. ඒ. ඒ. පුෂ්පා රංජනී මහත්මිය හිමිකම් කියන කුඹුරු ඉඩම<br>6. ඒ. ඒ. නිමල් වික්‍රමතිලක මහතා හිමිකම් කියන කුඹුරු ඉඩම | 610 කවිසිගමුව | අඩි 556 | අඩි 10 | 7794 |


(M.S.I)
037 - 2236464
072 - 6252880
071 - 7716769
පිඹුරු අංකය - 7794
පරිමාණය 1 : 1000
වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ
වැඩ විල්ලි හත්පත්තුවේ හේවා විජය කෝරළේ
රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ
අංක. 610 දරණ කව්සිගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ
කව්සිගමුව ගමේ පිහිටි
" සුරිය මාවත " නැමති පාර මා විසින් මැන සාදන ලද
පිඹුර
මායිම් ඉහත පිඹුරේ සඳහන් පරිදි වේ.
1
0.0516
0
0
20.4
දිග - අඩි. 556
පළල - අඩි. 10
2018 - 08 - 15

04-928

## රිදීගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 2353 යටතේ සඳහන් කොට ඇති මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත සම්භන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. විල්බට් කුලතුංග,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.


2018 ඔක්තෝබර් මස 18 වැනිද,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

### කොස්ගහමුල හේන මාර්ගය

| මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | අවසානය | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් | මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් | ග්‍රාම නිලධාරී වසම සහ අංකය | මාර්ගයේ දිග අඩි | මාර්ගයේ පළල අඩි | මාර්ග සිතියම අදළ පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| කොස්ගහ මුල හේන මාර්ගය | එස්. ඩී. ජයතිලක මහතාගේ නිවස අසළින් | එස්.එම්. කුලතුංග මහතාගේ ඉඩමෙන් | 1. එස්.ඩී.ජයතිලක මයා<br>2. එම්.ඩී.ගුණසිංහ මයා<br>3. එන්.ජී.සුනිල් ප්‍රේමරත්න මයා<br>4. එම්.ඩබ්.ජී.කපුගේ මයා<br>5. ඩබ්.ඒ.වීරසිංහ මයා<br>6. ගොරකදෙල වත්ත | 1. එච්.ඒ.නන්දවතී මිය<br>2. එම්.ඩී.ගුණසිංහ මයා<br>3. එන්.ජී.සුනිල් ප්‍රේමරත්න මයා<br>4. එම්.ඩබ්.ජී.කපුගේ මයා<br>5. ඩබ්.ඒ.වීරසිංහ මයා<br>6. ඩී.එම්.තිස්ස මයා<br>7. ඩබ්.ඒ.ගුණපාල මයා<br>8. ඩබ්.ඒ.එස්.රත්නායක මයා<br>9. එස්.එම්.අතුලාවතී මිය<br>10. එස්.එම්.කරුණාරත්න මයා<br>11. එස්.එම්.කුලතුංග මයා | 534 කටියාව | අඩි 2233 | අඩි 10 | 2353 |

ඒ.එම්.ජේ.බණ්ඩාර
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
කැප්පිටිගල පාර
රිදීගම
දුරකථන :- කාර්යාලය 037 2251494

පිඹුරු අංකය : 2353




යොමුව

| | |
|---|---|
| ක පැවැ. | කම්බි පැල ඉනි වැට |
| ලී | ලී කුළුද්දය |
| ග | මායිම් ගල |

පරිමාණය 1 : 4000

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ

රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රිදීගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ඉහළ විසිදෙක් [illegible] කෝරළේ අංක 534

කට්ටාව ග්‍රාම නිලධාරී වසමේ කට්ටාව ගමේ පිහිටි කොස්ගහමුල හේන නමැති ඉඩම දැනට මාර්ගය මා විසින් මැන සාදන ලද.

පිඹුර

| කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | | විස්තරය |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර | අක | රූඩ | පර් | |
| 1 | 0.1944 | 0 | 1 | 36,8 | මාර්ගය පළල මීටර 3.03 මුළු දිග මීටර 670 |

මායිම් ඉහත සඳහන් පරිදි වේ

බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.1944

මැනීම/කොටස් කිරීම 2018 . 07 . 29

දිනය 2018 . 07 . 31

බලයලත් මිනින්දෝරු

ඒ.එම්.ජේ. බණ්ඩාර
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
කැප්පිටිගල පාර,
රිදීගම.
037-2251494/ 072-3441522

## රිදීගම ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 2358 යටතේ සඳහන් කොට ඇති මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කේ. විල්බට් කුලතුංග,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව, රිදීගම.

2018 සැප්තැම්බර් මස 14 වැනි දින,<br>
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### බඹරගහකන්ද පහළගම්මැද්ද ගම මැද මාර්ගය

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *අවසානය* | *මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම* | *මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම්* | *ග්‍රාම නිලධාරී වසම සහ අංකය* | *මාර්ගයේ දිග අඩි* | *මාර්ගයේ පළල අඩි* | *මාර්ග සිතියම අදාළ පිඹුරුපත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|
| පහළගම්මැද්ද ගම මැද මාර්ගය | ජී. ජී. සිරිසේන මහතාගේ ඉඩම අසළින් | ඩබ්. ජී. වික්‍රමසිංහ මහතාගේ ඉඩම | 1. ජී. ජී. සිරිසේන මයා<br>2. ඒ. ජී. අමරසූරිය මයා<br>3. ඩබ්. ජී. ජයසිංහ මයා<br>4. කේ. ඩී. අනුලාවතී මිය | 1. ජී. ජී. සෝමදේව මයා<br>2. පී. ඩී. විජේරත්න මයා<br>3. ඩබ්. ජී. වික්‍රමසිංහ මයා | 574 බඹර ගහකන්ද | අඩි 416 | අඩි 08 | 2358 |

04-926

## දෙවිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 133/2019 යටතේ සඳහන් කර ඇති මංමාවත දෙවිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොද ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස වාචිකව පහත පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය පළවූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ආකාරය ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් පහත සඳහන් මංමාවත දෙවිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.


සුජීව වෙදගේ,
සභාපති,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව.

### වදුරදෙනිය පුරාණ විහාර මාවත

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *අවසානය* | *මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම්* | *මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම්* | *ග්‍රාම නිලධාරි වසම හා අංකය* | *මාර්ගයේ දිග අඩි* | *මාර්ගයේ පළල අඩි* | *මාර්ග සිතියම අදාළ පිඹුරුපත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|
| වදුරදෙනිය පුරාණ විහාර ප්‍රවේශ මාර්ගය | පළාත් සභා මාර්ගයේ ප්‍රාදේශීය සභා රථගාල ළඟින් | මලපලාවත්ත මාර්ගය ආරම්භය දක්වා | පාලුවත්ත ඉඩම වදුරදෙනිය විහාරයේ ඉඩම | ප්‍රාදේශීය සභා රථගාල ඉඩම, පෙරපාසැල් ඉඩම, සිරි උපතිස්ස පිරිවෙන් ඉඩම | කපුගම බටහිර 435 | 175 (මීටර්) | 05 (මීටර්) | 133/2019 |

කීර්ති දිසානායක
බලයලත් මිනින්දෝරු

පිඹුරු අංක 133/2019




පරිමාණය 1 : 1000

දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ
දෙවිනුවර පාදේශීය ලේකම් කොට්ඨාශයේ (වැල්ලබඩ පත්තුවේ)
දෙවිනුවර පාදේශීය සභා බල පදේශය තුල කපුගම බටහිර ගමෙහි
පිහිටි, " වදුරුදෙනිය පුරාණ විහාර මාවත " මැන පෙන්වන
පිඹුර

පමාණය

| කැබලි අංක | හෙක් | අ. | රූ. | ප | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|
| 1 | 0.0925 | 0 | 0 | 36.57 | මාර්ගයේ දිග මී 175 |

මනින ලද දිනය 2019.01.18

2019-03-10

## අතුරු ව්‍යවස්ථා සංශෝධනය

දඹුල්ල මහා නගර සභාව

**නිවේදනය**

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 267 (1) අ වගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක,
මහා නගර සභාව,
දඹුල්ල.

2019 මාර්තු මස 29 වැනි දින.

*තීරණය*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංසික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1)වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1989.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ, 2011.11.04 වැනි දින අංක 1731 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් දඹුල්ල මහා නගර සභාව වැළඳගන්නා ලද 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙහි XVIII වැනි කොටසෙහි **වාහන නතර කර තැබීම** පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි, මෙම තීරණය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද දිනයේ සිට පහත සඳහන් වගන්තීන් එක්කර සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 267 (1) උප වගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමු.

1. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය උවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල,

**වාහන නතර කර තැබීමේ පොදු බිම් කඩ යන්නෙන්** - දඹුල්ල මහා නගර සභාව විසින් වීථිවල වාහන නතර කර තැබීමට වෙන් කර ඇති බිම්කඩ හා දඹුල්ල මහා නගර සභාව විසින් වරින්වර ප්‍රකාශයට පමුණුවා ඇති හෝ පමුණුවනු ලබන පොදු රථ හා කුලී රථ සඳහා ඇති ගාල් ද අදහස් වේ.

සභාව යන්නෙන් දඹුල්ල මහා නගර සභාව ද,

නාගරික කොමසාරිස් යන්නෙන් තත්කාලයේ දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ද අදහස් වේ.

2. පෞද්ගලික රථගාල් පාලනය කිරීම සහ ගාස්තු අයකර ගැනීමට මහ නගර සභාවට බලය පැවරී ඇත. එම ගාස්තු දඹුල්ල මහා නගර සභාවේ මහ සභාව විසින් විටින් විට යෝජනා සම්මතයකින් තීරණය කරනු ලැබිය හැකි අතර එය රජයේ *ගැසට් පත්‍රයේ* පලකරවා ප්‍රසිද්ධ කල යුතුය.

8. (අ) අවසර පත්‍රයක් නොමැතිව රථවාහන නතර කිරීම සඳහා වෙන් කර ඇති ඉඩකඩක වාහන නතර කර ඇත්නම් ඒ වාහන එම ස්ථානයෙන් ඉවත් කර දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලබන ස්ථානයකට ගෙන ගොස් ගාල් කළ හැකි ය. මේ සඳහා පොලීසිය සහය ලබා දිය යුතුය.

මෙසේ ඉවත් කිරීමේ දී වාහනයට වන අලාභහානිය සඳහා දඹුල්ල මහා නගර සභාව හෝ එම වාහනය ඉවත් කරන නිලධාරියා ගෙන් වන්දියකක් ඉල්ලීමට වාහන අයිතිකරුට හෝ රියැදුරුට හිමිකමක් නැත. එවැනි වාහන මුදවා හැරීම සඳහා වාහනය නියමිත

ස්ථානයට ගෙන ඒමේ වියදමත්, එය ආරක්ෂා කිරීමේ වියදමත් නාගරික කොමසාරිස් විසින් තක්සේරු කරනු ලබන වෙනත් වියදම් ද අයිතිකරු හෝ රියැදුරු විසින් දඹුල්ල මහා නගර සභාවට ගෙවිය යුතුය.

17. (ඈ) දඹුල්ල මහා නගර සභාව විසින් විශේෂ රථගාල් වශයෙන් හඳුන්වා ඇති පෞද්ගලික ස්ථාන පිළිබඳව, දඹුල්ල මහා නගර සභාවේ මහ සභාව විසින් විටින් විට යෝජනා සම්මතයකින් තීරණය කරනු ලබන ගාස්තු රජයේ *ගැසට් පත්‍රයේ* පලකරවා ගැනීමෙන් පසු ගෙවා, ගිවිසුමකට ඇතුළත් වී මාසික බලපත්‍රයක් ලබා ගත යුතුය.

19. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන බල මණ්ඩලයක් හැර වෙනත් ආයතන සඳහා දඹුල්ල මහා නගර සභාව විසින් වරින්වර තීරණය කරනු ලබන ගාස්තු ප්‍රමාණයක් ගෙවා ගිවිසුමක් මත මාසිකව, අවසර පත්‍රයක් ලබා ගත යුතුය.

### තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1)වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1989.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ, 2011.11.04 වැනි දින අංක 1731 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් දඹුල්ල මහා නගර සභාව වැළඳගත්තා ලද 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙහි II (ii - වන කොටසෙහි) **මාළු විකිණීම** පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි, මෙම තීරණය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** පල කරන ලද දිනයේ සිට පහත සඳහන් වගන්තීන් 25 හා 26 අංක යටතේ එක්කර සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 267 (1) උපවගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමු.

25. සියලුම මාළු වෙළඳසැල් පෙරවරු 6.00 සිට පස්වරු 10.00 දක්වා අලෙවිය සඳහා විවෘතව තැබිය යුතුය.

26. මිරිදිය හා කරදිය මාළු හැර වෙනත් කිසිඳු මස් වර්ගයක් විකිණීම සපුරා තහනම් වන අතර ශීතකළ, පැකට් කරන ලද මාළු විකිණීම ද සපුරා තහනම් ය.

### තීරණය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1)වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1989.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ, 2011.11.04 වැනි දින අංක 1731 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් දඹුල්ල මහා නගර සභාව වැළඳගත්තා ලද 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙහි II xxxiv - වන කොටසෙහි **ලැගුම් නිවස** පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි, මෙම තීරණය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරන ලද දිනයේ සිට පහත සඳහන් වගන්තීන් එක්කර සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමට 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 267 (1) උපවගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමු.

3. (viii) සියලුම කාමර ආරක්ෂිත දොරගුළු යොදා ආගන්තුකයන්ගේ සහ ඔවුන්ගේ බඩු බාහිරාදියෙහි ආරක්ෂාව සැලසෙන පරිදි කටයුතු කර තිබිය යුතුය.

* සියලුම කාමර සඳහා විදුලි බලය හෝ විකල්ප බල ශක්ති මගින් ප්‍රමාණවත් ආලෝකයක් සපයා ගැනීමට පහසුකම් සලසා තිබිය යුතුය.

* කාමරයක වර්ග ප්‍රමාණය අවම වර්ග අඩි 90ට වැඩි විය යුතු අතර වාතාශ්‍රය ලබා ගැනීම සඳහා මෙහි වර්ග ප්‍රමාණයෙන් 1/7 හෝ ඊට වැඩි ප්‍රමාණයකින් යුක්ත වන ප්‍රමාණයක් කවුළු සපයා තිබිය යුතුය.

* ජලාශ ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන ලැගුම්හල්වල වැසිකිළි/ කැසිකිළි වළවල් හා කාණු පද්ධති ප්‍රධාන ජල මූලාශ්‍ර වලට කාන්දු නොවන ආකාරයට විධිමත් හා සෞඛ්‍ය ආරක්ෂිත තත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

* ගොඩනැගිල්ල සඳහා මහා නගර සභාවේ හෝ නාගරික සංවර්ධන අධිකාරියේ අනකූලතා සහතිකය ලබාතිබිය යුතුය.

8. විශේෂයෙන් පාසල් ළමුන් ඇතුල් කර ගැනීම හෝ පහසුකම් සැලසීම හෝ නොකළ යුතුය.

9. කිසිම ලැගුම්හලක මත්පැන් විකිණීම, ගබඩා කිරීම හෝ පරිහරණයට ඉඩකඩ සැලසීම නොකල යුතුය.

11. වායු සමීකරණය කර ඇති කාමර වලද විවෘත කල හැකි ජනෙල් සවිකර තිබිය යුතුය.

13. කිසිම ලැගුම් හලක බලපත්‍රධාරියෙකු විසින් ම එක් වරක් භාවිතා කරන ලද ඇඳ ඇතිරිලි, කොට්ට, මෙට්ට, පිරිසිදු කිරීමෙන් තොරව නැවත භාවිතා කිරීම සඳහා අමුත්තන්ට නොදිය යුතුය.

15. නාගරික කොමසාරිස් විසින් පනවනු ලබන ගාස්තුවක් ගෙවීමටත් නාගරික කොමසාරිස් විසින් නියම කරනු ලැබිය හැකිය. එම ගාස්තු දඹුල්ල මහ නගර සභාවේ මහ සභා තීරණයක් මගින් ගනු ලැබිය හැකි අතර ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කළ යුතුය.

### ලැගුම්හලක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය

මෙහි පහත අත්සන් කරන මම මෙහි පහත සඳහන් ස්ථානය (252 වන අධිකාරය) මහ නගර සභා ආඥා පනත යටතේ සම්මත කර ඇති අතුරු ව්‍යවස්ථා යටතේ කුලී අය කරනු ලබන ලැගුම්හලක් ලෙස ලියාපදිංචි කරවා ගැනීම සඳහා මෙයින් ඉල්ලුම් කරමි.

ඉල්ලුම්කරුගේ නම :-..........................................................................................................................................................................

ලිපිනය :-......................................................................................................................................................................

දිනය :-......................................................................................................................................................................

කුලී අය කරනු ලබන ලැගුම්හලක් ලියාපදිංචි කරවා ගැනීම සඳහා ඉල්ලුම් කරන ස්ථානයේ පිහිටීම.

.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................

නවාතැන් ගන්නවුන් සඳහා වෙන් කර ඇති කාමර සංඛ්‍යාව ..................................................................................

කුලී අය කරනු ලබන නවාතැන්පලක් ලෙස පාවිච්චි කිරීමට අදහස් කරන තට්ටු ගණන (ඝන ධාරිතාව) ................................................

නවාතැන් ගන්නවුන් සඳහා වෙන් කර ඇති ජෝඩු කාමර සංඛ්‍යාව (ඝන ධාරිතාව) ..................................................................................
ඉල්ලුම්කරුගේ අත්සන හා දිනය ..................................................................................

### ලැගුම්හල් ලේඛනයෙහි ආකෘතිය

දිනය ..................................................................................

ලියාපදිංචි අංකය..................................................................................

ලැගුම්හල පිහිටීම හා වීථි අංකය ..................................................................................

නිදන කාමර සංඛ්‍යාව ..................................................................................

තනි කාමර සංඛ්‍යාව ..................................................................................

ජෝඩු කාමර සංඛ්‍යාව ..................................................................................

මුළුතැන් ගෙවල් සංඛ්‍යාව ..................................................................................

වැසිකිළි සංඛ්‍යාව ..............................................................

පූතික වලේ ධාරිතාවය මා සංඛ්‍යාව (දිග x පළල x උස) .................................................................................

භාරගත හැකි උපරිම ආගන්තුක සංඛ්‍යාව ...................................................................................

භාරකරුගේ අත්සන ..................................................................................

ලියාපදිංචි කරන නිළධාරියාගේ අත්සන ..................................................................................

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංසික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1)වන උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1989.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ, 2011.11.04 වැනි දින අංක 1731 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් දඹුල්ල මහා නගර සභාව වැළඳගන්නා ලද 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙහි II ii - වන කොටසෙහි ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි, මෙම තීරණය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද දිනයේ සිට පහත සඳහන් වගන්තීන් එක්කර සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 267 (1) උප වගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමු.

1. (ඕ) දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් මාර්ගයක්, පොදු ස්ථානයක්, වට රවුමක්, මෝටර් වාහන සංඥා හැඳින්වීම සඳහා අනුග්‍රාහක දායකත්වයන් යටතේ සකස් කරන ලද දැන්වීමක්.

(ඖ) යම් ව්‍යාපාරික ස්ථානයක් එම ව්‍යාපාරික ස්ථානයේ නම, ලිපිනය, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය හා එම ව්‍යාපාරය කරන්නාගේ නම පමණක් සඳහන් වන පරිදි පිළියෙල කර ඇති දැන්වීමක්

එසේ වුවද කිසියම් ව්‍යාපාරික සථානයක එම ව්‍යාපාරයේ නම ලිපිනය, දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය හා එම ව්‍යාපාරයේ කරන්නාගේ නම සඳහන් වී ඊට අතිරේක වන පරිදි අනුග්‍රාහකයෙකුගේ හෝ වෙනත් යම් භාණ්ඩයක හෝ ද්‍රව්‍යයක හෝ සේවාවක නමක් ලකුණක් හෝ වෙනත් සඳහනක් ප්‍රචාරණය සඳහා කරුණු යෙදී ඇත්තේනම් අදාල ප්‍රචාරක දැන්වීමේ පුවරුවේ ඊට සාපේක්ෂ කොටස සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් සඳහා වන විධි විධාන අදාළ විය යුතුය.

3. (3) දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් සමඟ පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.

(අ) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂව 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම

(ආ) 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූ සටහන

(ඇ) එම සැලැස්මේ, රූප සටහනේ හෝ පිරිවිතයෙහි, මේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව වනු පිණිස කරන සංශෝධන වෙතොත් එම සංශෝධන.

(ඈ) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවක අඳින ලද ඒ දැන්වීමේ පිටපතක්

(ඉ) යාබද වීථි සහ ප්‍රධාන භූමිය

I. දඹුල්ල මහ නගර සභාවෙහි නාගරික කොමසාරිස් විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම්වලට, රූප සටහන් වලට සහ පිරිවිතරයන්ට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින්

දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්. දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම නොකළ යුතුය.

II. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලුම්පත්‍රයක් ම දඹුල්ල මහ නගර සභාවෙහි නාගරික කොමසාරිස් විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, තීරණය කර නියමිත ගාස්තු ගෙවන තෙක් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතුය.

III. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් නිකුත් කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකට එම බලපත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුලත් කරන ලෙස, දඹුල්ල මහා මහා නගර සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

IV. දඹුල්ල මහා නගර සභාවේ මහසභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දැක්වෙන සහ *ගැසට් පත්‍රයේ* යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක, කිසිම ප්‍රචාරක දැන්වීමක්, ඒ දැන්වීම දඹුල්ල මහා නගර සභවේ නාගරික කොමසාරිස් විසින් අනුමත කල ආකාරයට තනා හෝ ඉදිකර ඇති දැන්වීම් පුවරුවක් වන්නනේ නම් මිස ප්‍රදර්ශනය නොකළ යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ප්‍රචාරක දැන්වීම් යන්නෙන් ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා, මහ නගර සභා හෝ පෞද්ගලික් මාර්ගයට පෙනෙන සේ පුවරු, බැනර්, කටවුට්, ඇලුමිනියම් තහඩු, යකඩ, පොලීතින්, රෙදි හෝ කොලවල ඇඳීමෙන් ද නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් කරන ලද දැන්වීම් පුවරුවක් ද, නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදී ස්ථානයක අකුරු හෝ රූප යොදා යම් වෙළෙඳ ස්ථානයක්, වෙළෙඳ භාණ්ඩයක්, ව්‍යාපාරයක් සඳහා කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ද, වෙළඳ ප්‍රදර්ශනයක, සැණකෙළියක ආදී උත්සව අවස්ථාවන් හිදී යොදන විශේෂ දැන්වීම් විද්‍යුත් නාම පුවරු ද අදහස් වන්නේ ය.

9. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍ර සඳහා ගාස්තු ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමකට දඹුල්ල මහ නගර සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සලකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තෙකු විසින් විරූප කිරීම නොකළ යුතුය.

11.

i. අතුරු ව්‍යවස්ථාව යටතේ වරදට වරදකරු වීමෙන් පසු දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව දඹුල්ල මහා නගර සභාව විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල වන්නේය.

ii. එලෙස යම් තැනැත්තෙකු හෝ ආයතනයක් දිගිනි දිගටම බලපත්‍රයක් ලබානොගෙන ප්‍රචාරක දැන්වීම් පළ කිරීම හේතු කොට ගෙන හෝ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සඳහන් කොන්දේසි කඩ කිරීම හේතු කොට ගෙන වරදකට වරදකරුවකු වී ඇති අවස්ථාවක දී එකී තැනැත්තා හෝ ආයතනය දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක කාර්යයක් සඳහා අසාධු ලේඛනගත කිරීම පිළිබඳ දඹුල්ල මහා නගර සභාව තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

iii. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු අවසර පත්‍රයේ වලංගු කාලය ඉදිරියට ඉතිරිව තිබිය දී වුව ද, යම් අයුරකින් සවිකරන ලද, බිත්තියක හෝ තාප්පයක අඳින ලද බැනරයක්, කටවුට් එකක් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් කෙසේ හෝ සුළඟට ඇළවී, ගැලවී, බිම ඇද වැටී හෝ දුර්වර්ණ වී කැඩී බිඳී, වෙනස් වී නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ බාධා වේ නම් එබඳු දැන්වීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාල අයිතිකරු වෙත භාර දීමෙන් පසු දින 07 ක් ඇතුලත යථා පරිදි සකස් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ නොමැතිනම් දඹුල්ල මහ නගර සභාව විසින් එය ඉවත් කළ යුතුය. දඹුල්ල මහ නගර සභාව විසින් එසේ දැන්වීමෙන් දින 14 ක් ගත වීමෙන් පසු දඹුල්ල මහ නගර සභාවේ සේවකයන් යොදවා දැන්වීම ඉවත් කිරීමට සිදුවුවහොත් එකී දැන්වීම පිළිබඳ කිසිම වගකීමක් දඹුල්ල මහ නගර සභාව විසින් නොදැරිය යුතුය.

iv. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 276 වගන්තිය (3) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩණයේ උපරිමය විය යුතුය.

## 01 උපලේඛනය

## ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ඉල්ලුම්පත්‍රය

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-..................................................................................

02. ස්ථිර ලිපිනය :-..................................................................................

03. අයදුම්කරුගේ දුරකථන අංකය :-.................................................... විද්‍යුත් තැපැල් ලිපිනය : ..............................................................

04. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන වෙළෙඳ ව්‍යාපාරය : ..................................................................................
උත්සවය, ප්‍රදර්ශනය, සැණකෙළිය, රැස්වීම හෝ වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳ විස්තරය : ..............................................................

05. දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වන ස්ථානය/ස්ථාන :...................................

06. අදාළ ආකෘතිය අමුණා තිබේද :..................................................................................

07. ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීම් වර්ගය (බැනර්, පුවරු, කටවුට්, බිත්ති, තාප්ප හෝ ස්ථාවර) :.........................................

08. යම් අයුරකින් තම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසුව ද දැන්වීම් දුර්වර්ණ වීම, ඇලවීම, ගැලවීම, බිමට කඩා වැටීමක් සිදුවුවහොත් යථා පරිදි සකස් කිරීමට එකඟ වන්නේ ද? ........................................................................

මහා නගර සභාවේ පිළිගත් නියමයන්ට එකඟව දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට එකඟවන අතර ඒ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හෝ එහි යම් වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ද, හොඳාකාරවම මම දනිමි.

............................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

පහත සඳහන් ලේඛන අමුණා ඇත.

i. ප්‍රචාරක දැන්වීම් අයදුම්කරුට අයිතිවාසිකම් නොමැති දේපළක ප්‍රචාරය කරන්නේ නම් එම දේපළට අයිතිවාසිකම් ඇති අයගේ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය.

ii. අතුරු ව්‍යවස්ථාවේ 3 වන වගන්තිය යටතේ අවශ්‍යතා සනාථ කරන ලේඛන.

## කාර්යාල ප්‍රයෝජනය සඳහා

වැඩ අධිකාරි / කාර්මික නිලධාරි

නම ..............................................................................
පරීක්ෂා කළ දිනය ....................................................
පුවරුවේ දිග ...................................... පළල ......................
වෙනත් සටහන් ......................................................
..............................................................................
නිර්දේශ කරයි / නොකරයි

අත්සන ..............................................

ආදායම් පරීක්ෂක නිලධාරි

නම ..............................................................................
පරීක්ෂා කළ දිනය ....................................................
පුවරුවේ දිග ......................................
වෙනත් සටහන් ......................................................
..............................................................................
නිර්දේශ කරයි / නොකරයි

අත්සන ..............................................

විෂය ලිපිකරු ..............................................................................
ලබාදුන් අංකය හා දිනය ..............................................................
පුවරුව සඳහා අයකළ ගාස්තුව.......................................................
විෂය ලිපිකරුගේ නම ..................................................................
දිනය ........................................................ අත්සන ..............................................

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1)වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 1989.01.20 වැනි දින අංක 541/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ, 2011.11.04 වැනි දින අංක 1731 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් දඹුල්ල මහා නගර සභාව වැළඳ ගන්නා ලද 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙහි II (vii) - වන කොටසෙහි පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙහි, මෙම තීරණය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දිනයේ සිට පහත සඳහන් වගන්තීන් එක්කර සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 267 (1) උපවගන්තියෙන් මහා නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමු.

2. *(ඈ)* විමර්ශන අංශය
*(ඉ)* ළමා අංශය
*(ඊ)* වාර සඟරා අංශය
*(උ)* පුවත්පත් අංශය
*(ඌ)* ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය
*(එ)* ශ්‍රවණාගාරය
*(ඒ)* ශාඛා පුස්තකාලය
(ඔ) ජංගම පුස්තකාලය
*(ඕ)* අධ්‍යන අංශය
*(ඖ)* දුර්ලභ ග්‍රන්ථ හා ග්‍රන්ථ සංරක්ෂණ අංශය
*(ක)* ආබාධිත ප්‍රජාව සඳහා පුස්තකාල සේවා අංශය
*(ග)* ප්‍රජා තොරතුරු සේවා අංශය
*(න)* ඡායා පිටපත් සේවා අංශය
*(ච)* විශේෂිත එකතු හා ප්‍රාදේශීය එකතු අංශය.

3. (1) (ඇ) බල ප්‍රදේශයේ ජනතාව අදහන ආගම් නියෝජනය වන පරිදි එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බැගින් පත් කරනු ලබන ආගමික නායකයන් උපරිම ලෙස තිදෙනෙකු.

*(ඉ)* තත්කාලයේ පුස්තකාලයට භාරව සිටින නිලධාරියා කමිටුවේ ලේකම් විය යුතුය.

4. (1) මහජන පුස්තකාල සේවාවට උපදේශකත්වය හා මගපෙන්වීම සඳහා මෙහි මින්මතු කමිටුව නමින් හඳුන්වනු ලබන පුස්තකාල උපදේශක කමිටුවක් පත්කර ගත යුතුය. එම කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත වේ.

*අ.* සභාවේ එවකට සිටින නගරාධිපතිවරයා සහ උප නගරාධිපතිවරයා නිල බලයෙන් කමිටුවෙහි සාමාජිකයන් වේ.

5. ගණ පූර්ණය සභාව විසින් පත්කර ඇති සාමාජික සංඛ්‍යාවෙන් 1/3ක් විය යුතුය.

*බැහැර දෙන අංශය :*

7. *(අ)* ළමා සාමාජිකත්වය සඳහා වයස අවුරුදු 14 ට අඩු හා වයස අවුරුදු 06ට වැඩි විය යුතුය.

*(ඇ)* පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ද අධ්‍යාපනය ලබන්නෙකු නම් විදුහල්පතිගේ සහතිකය ද රැකියාවක් කරන්නේ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය ද ඉදිරිපත් කර සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කළ යුතුය.

8. *(ඒ)* පුස්තකාල කමිටුවේ සාමාජිකයෙක්
*(උ)* බල ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරිවරයා

14. සාමාජිකයෙකු විසින් බැහැර ගෙන ගිය පොතක් නැති වූ බව වාර්තා කළ අවස්ථාවක දී එම පොතේ පිටපතක් ලබාගෙන පුස්තකාලයට ලබා දිය යුතුය. එම පොතෙහි පිටපතක් ලබා ගැනීමට නොහැකි අවස්ථාවක දී එම පොතේ වර්තමාන වටිනාකම හා 25% ක අතිරේක ගාස්තුවක් අයකර ගත යුතුය. එම ගෙවීම් පැහැර හැර ඇති අවස්ථාවක දී ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

16. එසේ හානිකර ඇති පොතක් ආපසු භාරදෙන අවස්ථාවේ දී පුස්තකාලයාධිපති විසින් තක්සේරු කරන ලද අලාභය සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

24. බැහැර දෙන පුස්තකාලය ඉරිදා දින හා ප්‍රසිද්ධ නිවාඩු දින සහ යටත් පිරිසෙයින් සාමාජිකයන්ට දවස් 07 ක දැනුම්දීමකින් පසු, තොග ගණන් දීම සඳහා හා කමිටුව විසින් නියම කරන වෙනත් යම් දිනයන් හී හැර, දිනපතා පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 අතර කාලය තුල විවෘතව තැබිය යුතුය.

25. (1) **විමර්ශන අංශය.**

වයස අවුරුදු 14ට වඩා වැඩි කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ඕනෑම තැනැත්තෙකුටම විමර්ශන පුස්තකාලය පරිහරණය කිරීමට සුදුසුකම් ඇත.

විමර්ශන පුස්තකාලය පරිහරණය කිරීමට අවශ්‍ය අයෙක් තම අනන්‍යතාවය තහවුරු කර පාඨක ලේඛණයේ නම, ලිපිනය, අත්සන තබා පුස්තකාලයාධිපති ගේ අවසරය ලබා ගත යුතුය.

විමර්ශන පුස්තකාලයට හිස් කඩදාසි හැර වෙනත් කිසිඳු ලිපි ද්‍රව්‍යයක් ගෙන ඒමට අවසර නොමැති අතර පාඨකයෙකු විසින් විමර්ශන පුස්තකාලයට ගෙන යාමට අවශ්‍ය යැයු පුස්තකාලයාධිපති විසින් අවසර දෙන ලේඛන පමණක් එහි ගෙන යා යුතුය.

විමර්ශනය සඳහා ලබා ගන්නා කිසිදු පොතක් කිසිදු තැනැත්තෙකු විසින් විමර්ශන පුස්තකාලයෙන් බැහැරට ගෙන යාම නොකළ යුතුය.

විමර්ශනය සඳහා පැමිණෙන පාඨකයෙකු විමර්ශන පුස්තකාලයෙන් බැහැරව වෙනත් අංශයක ඇති පොතක්, ලේඛනයක්, වාර සඟරාවක් විමර්ශනය සඳහා අවශ්‍ය වන්නේ නම් විමර්ශන පුස්තකාලයේ පුස්තකාලයාධිපතියේ අවසරය ලබාගෙන පරිහරණය කර නැවත තිබූ ස්ථානයෙහි තැබිය යුතුය.

මහජන පුස්තකාලය විවෘතව තබන වේලාවන් හිදී විමර්ශන පුස්තකාලයද විවෘතව තැබිය යුතුය.

අවසර ලබා දී ඇති ලිපි ලේඛන වල පිටපත් දඹුල්ල මහ නගර සභාවේ මහ සභාව විසින් තීරණය කරන ලද ගාස්තුවකට හා පුස්තකාලයාධිපතිගේ අවසරයට යටත්ව ලබා ගත හැකිය.

(2) ළමා අංශය

ළමා පුස්තකාලය බල ප්‍රදේශය තුළ අවුරුදු 14ට අඩු අවුරුදු 05ට වැඩි ළමයින් සඳහා විය යුතුය.

ළමා පුස්තකාලය විවෘතව තබන වේලාවන් පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශ අනුව මහා නගර සභාව විසින් නියම කරනු ලැබිය හැකි අතර, එම වේලාවන් පැහැදිලිව පෙනෙන ආකාරයට පුස්තකාලය ඉදිරිපස දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කළ යුතුය.

ළමා පුස්තකාලය තුළට (පරීක්ෂා කිරීමට බලය ලත්) මහා නගර සභා පුස්තකාලයේ කාර්යය මණ්ඩලයේ නිළධාරීන් හා සේවකයන් හැර වෙනත් වැඩිහිටි අයෙකුට ඇතුලත් වීමට අවසර ලබා නොදිය යුතුය.

(3) වාර සඟරා අංශය

වයස අවුරුදු 14ට වැඩි කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ඕනෑම අයෙකුට වාර සඟරා අංශය පරිහරණය කිරීමට අවසර තිබිය යුතුය.

තම අනන්‍යතාවය තහවුරු කර පාඨක ලේඛනයේ නම, ලිපිනය හා අත්සන තබන අයෙකුට පුස්තකාලාධිපති විසින් එම අවසරය ලබා දිය යුතුය.

බැහැරින් කිසඳු වාර සඟරාවක් පුවත්පතක් ලිපි ගොනුවක් හෝ යම් උපකරණයක්, ගමන් මල්ලක්, වාර සඟරා අංශය තුළට රැගෙන නොයා යුතුය.

මහජන පුස්තකාලය විවෘතව ඇති කාලය තුළ වාර සඟරා අංශය විවෘතව තැබිය යුතුය.

(4) පුවත්පත් අංශය

පාඨකයින්ගේ පැමිණීමේ ලේඛනයේ නම, ලිපිනය හා අත්සන තබන හා තම අනන්‍යතාවය තහවුරු කරන ඕනෑම අයෙකු සඳහා මෙම අංශයට ඇතුලත් වීමේ අවසරය ලබා දිය යුතුය.

දිනපතා හා සතිපතා පුවත්පත් මෙම අංශය තුල තිබිය යුතු අතර, පසුගිය මාසයක කාලය තු ප්‍රකාශයට පත් කල පුවත්පත් පමණක් සංරක්ෂණය කළ යුතුය.

මාස 01 ට වැඩි කාලයක් ගත වූ පුවත්පත් එම අංශයෙන් බැහැර කල යුතු අතර මහ නගර සභාවේ ගබඩාවට සුදුසු කටයුතු සඳහා භාර දෙනු ලැබිය යුතුය.

පුවත්පත් අංශය විවෘතව තබන සතියේ දින හා වේලාවන් දඹුල්ල මහා නගර සභාවේ මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය.

(5) ශ්‍රව්‍ය දෘෂ්‍ය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණික අංශය

තම අනන්‍යතාවය තහවුරු කරන ලද පැමිණීමේ ලේඛණයේ නම ලිපිනය හා අත්සන තබන දඹුල්ල මහ නගර සභාව විසින් වරින් වර පනවනු ලැබිය හැකි ගාස්තුව ගෙවන ඕනෑම සාමාජිකයෙකුට පුස්තකාලයාධිපති විසින් මෙම අංශයට ඇතුල් වීමට අවසරය ලබා දිය යුතුය.

ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයේ හඬපට හා ශ්‍ර වන ආධාරක උපකරණ පරිශ්‍රයෙන් බැහැර ගෙන නොයා යුතුය.

හඬපට නිකුත් කිරීමේ දී හා ආපසු භාර ගැනීමේ දී පාඨකයා හා පුස්තකාලයාධිපතිවරයා විසින් ශ්‍රව්‍ය තත්වය පිළිබඳ සහතිකභාවය ලබා දිය යුතුය.

තොරතුරු සන්නිවේදන හා තාක්ෂණික අංශයේ පරිහරණය අපේක්ෂා කරන අය වෙනුවෙන් වෙනම ගාස්තු ප්‍රමාණය දඹුල්ල මහා නගර සභාවේ මහ සභාව විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකිය.

පිටපත් රැගෙන එනු ලබන සංයුක්ත තැටි හෝ වෙනත් පරිගණක මෘදුකාංග මෙම අංශයේ පරිගණක වල යෙදීම නොකල යුතුය.

මෙම අංශය යටතේ පවත්වාගෙන යන ඉලෙක්ට්‍රොනික තැපැල අන්තර්ජාල පහසුකම් නියමිත ගාස්තු ගෙනා ඕනෑම අයෙකුට ලබා ගැනීමට හැකියාව ඇත්තේය. මෙම ගාස්තු රජයේ *ගැසට් පත්‍රයේ* පල කරවා ප්‍රසිද්ධ කළ යුතුය.

මෙම අංශයේ භාවිතය සඳහා ඇති සංයුක්ත තැටි හෝ පරිගණක මෘදුකාංග කිසිම ආකාරයකින් පිටපත් කිරීම හෝ බැහැර ගෙන යාම සඳහා අවසර නොදිය යුතු අතර, එහි පිටපත් දඹුල්ල මහ නගර සභාවේ මහ සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ලැබීමෙන් පසු ඉල්ලුම් කරනු ලබන අයෙකුට නිකුත් කරනු ලැබිය යුතුය. මෙම ගාස්තු රජයේ *ගැසට් පත්‍රයේ* පලකරවා ප්‍රසිද්ධ කල යුතුය.

සංයුක්ත තැටි මඟින් පිටපත් ලබා ගැනීමට යම් පාඨකයෙකුට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පුස්තකාලයාධිපතිගේ අවසරය ලබා ගත යුතුය.

(6) ශ්‍රවනාගාරය

අධ්‍යාපනික, සංස්කෘතික සංවර්ධනය සඳහා වූ වේදිකා චිත්‍රපට, දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, විවිධප්‍රසංග පැවැත්වීම, ප්‍රසිද්ධ රැස්වීම් නොවන දේශපාලන වෘත්තීය සංගම් රැස්වීම්, ආගමික දේශන පැවැත්වීම සඳහා දඹුල්ල මහ නගර සභා මහජන පුස්තකාල ශ්‍රවනාගාරය සුදුසු අයදුම්කරුවන් සඳහා වෙන් කර දිය හැකිය.

ඉල්ලුම්කරනු ලබන අනුපිළිවෙලින් ඒ සඳහා ලේඛන ගත කල යුතු අතර දඹුල්ල මහ නගර සභාවේ මහ සභාව විසින් තීරණය කර අය කරනු ලබන ගාස්තු හා තැන්පත් මුදල් ගෙවීමෙන් පසු ශ්‍රවනාගාරය වෙන් කිරීම ස්ථිර කල යුතුය.

ශ්‍රවනාගාරය වෙන් කරනු ලබන දිනය හැර වෙනත් දිනයක් සඳහා වෙන් කිරීමට අයදුම්කරුවෙකු ඉල්ලීමක් කරන්නේ නම් එම ඉල්ලීම කරන වෙනත් දිනය පෙර ගෙවන ලද ගාස්තු හා තැන්පතු මත වෙන් කර දීමට හැකිය. එම වෙනත් දිනය වෙනත්

අයදුම්කරුවෙකුට වෙන් කර ඇති අවස්ථාවක දී මුල් දිනයේ දී ශ්‍රවනාගාරය භාවිතා නොකිරීම මත ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර තැන්පත් මුදල් පමණක් ආපසු ගෙවීමට හැකිය.

ශ්‍රවනාගරය වෙන් කිරීමේ බලය නාගරික කොමසාරිස්වරයාට හෝ ඒ සඳහා බලය පැවරූ නිළධාරියා වෙත පැවරෙන අතර සාධාරණ හේතු මත වෙන් කිරීම අත්හිටුවිය හැකිය.

ශ්‍රවණාගාරය වෙන් කර ගනු ලැබූ සෑම අයදුම්කරුවෙක්ම,

(අ) ශ්‍රවනාගාරයේ හා අවට පරිශ්‍රයේ ඇති උපකරණ, විදුලි උපාංග හා වෙනත් සියළුම සවිකිරීම් වලට අලාභ හානි නොවන ආකාරයට කටයුතු කල යුතුය.

(ආ) අශෝභන නුසුදුසු අපිරිසිදු ඇඳුමින් හා නොගැලපෙන චර්යාවෙන් යුතු අය ශ්‍රවනාගරය තුලට ඇතුල් වීම වැලැක්විය යුතුය.

(ඇ) බීමත්ව සිටින අයෙක් ඇතුල් කිරීම හෝ ශ්‍රවණාගාරය තුළ මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්වැටි පාවිච්චි කිරීම වැලැක්විය යුතුය.

(ඈ) යම් ආසාදන හෝ ස්පර්ශ රෝගයකින් පෙළෙන හෝ මෑතක දී පෙලුනු අයෙකු හෝ එවැනි අයට සාත්තු කල අයෙකු ශ්‍රවනාගාරයට ඇතුලවීම වැලැක්විය යුතුය.

(ඉ) සදාචාරයට හිතකර නොවන දර්ශන, පෝස්ටර්, පින්තූර, මූර්ති ප්‍රදර්ශනයට තැබීම වැලැක්විය යුතුය.

(ඊ) ශ්‍රවනාගාරට පැමිණෙන ප්‍රේක්ෂකයන්ගේ දේපළ, බඩු බාහිරාදිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම කල යුතුය.

(උ) දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව රාත්‍රී 12.00 ට පසු ශ්‍රවනාගාරයේ රැඳී නොසිටිය යුතුය.

(7) ශාඛා පුස්තකාලය

(අ) දඹුල්ල මහා නගර සභාව තීරණය කරන ආකාරයට මහජන පුස්තකාලයට අනුබද්ධව ශාඛා පුස්තකාල පවත්වාගෙන යා හැකිය.

(ආ) ශාඛා පුස්තකාලයේ අදාල සාමාජිකත්වය දඹුල්ල මහා නගර සභා සීමාව තුළ පදිංචිකරුවන්ට පමණක් සීමා විය යුතුය.

(8) ජංගම පුස්තකාලය

(අ) ප්‍රධාන පුස්තකාලයට හෝ ශාඛා පුස්තකාල වලට පැමිණීමට නොහැකි පුස්තකාල සාමාජිකයින් සඳහා දඹුල්ල මහා නගර සභා මහජන පුස්තකාලයට සම්බන්ධිත ජංගම පුස්තකාල පවත්වාගෙන යා හැකිය.

(ආ) ජංගම පුස්තකාල සේවා පවත්වාගෙන යනු ලබන ස්ථාන හා එම සේවය පවත්වනු ලබන වේලාව, දිනය පුස්තකාල සාමාජිකයින්ට පැහැදිලිව පෙනෙන ලෙද ප්‍රදර්ශනය කල යුතුය.

(ඇ) ජංගම පුස්තකාල සේවය භාවිතා කරන්නන්ට විශේෂිත අවසර පත්‍රයක් නිකුත් කල යුතු අතර ප්‍රධාන පුස්තකාලයට හෝ ශාඛා පුස්තකාලයට එම විශේෂිත අවසර පත්‍රය වලංගු නොවිය යුතුය.

(9) අධ්‍යයන අංශය

(අ) ප්‍රධාන පුස්තකාලයට ශඛා පුස්තකාලයන්ට අනුබද්ධ අධ්‍යයන අංශයක් පිහිටුවීම දඹුල්ල මහ නගර සභාවට තීරණය කල හැකිය.

(ආ) මෙම අධ්‍යයන අංශයට, පැමිණීමේ ලේඛනයෙහි අනන්‍යතාවය සහිතව අත්සන් තබන ඕනෑම අයෙකුට ඇතුල් වීමට අවසර දිය හැකිය.

(ඇ) පුස්තකාලයේ පොත්පත්, වාර සඟරා, පුවත්පත් අධ්‍යන අංශයට ගෙන යාමට හෝ එහිදී පරිහරණය කිරීමට අවසර නොදිය යුතු අතර පාඨකයින්ගේ පෞද්ගලික ලිපි ලේඛණ, පොත් පත් වැනි දෑ පමණක් පරිහරණයට අවසර දිය යුතුය.

(ඈ) පුස්තකාලය විවෘතව තබන කාලය තුළ අධ්‍යයන අංශවය ද විවෘතව තැබිය යුතුය.

(ඉ) ස්වකීය අධ්‍යයන කටයුතු හැර වෙනත් කාර්යයන් හි එහි පැමිණෙන පාඨකයින් නොයෙදෙන බවට පුස්තකාලයාධිපතිවරයා සැහීමකට පත්විය යුතු අතර නිකරුනේ ගැවසෙන හෝ වෙනත් කාර්යයක යෙදෙන අයවලුන් එම ස්ථානයෙන් බැහැර කරවිය යුතුය.

(10) දුර්ලභ ග්‍රන්ථ හා ග්‍රන්ථ සංරක්ෂණය අංශය :

ඓතිහාසික වැදගත්කමක් ඇති හෝ මුද්‍රණයේ නොමැති හා මිල දී ගැනීමට නොහැකි ඕනෑම විෂයයක් සම්බන්ධයෙන් ලියවී ඇති ඕනෑම ග්‍රන්ථයක් සංරක්ෂණය කිරීම සඳහා මෙම අංශය පිහිටුවා ගත හැක.

(අ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හෝ කෞතුකාගාරයට භාරදීමට නීතියෙන් බැඳී නැති අවුරුදු 50ට වඩා පැරණි දූනට මුද්‍රණයේ නොමැති හා මිලදී ගැනීමට නොමැති බවට හෝ පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නිර්දේශිත පොත්පත් වාර සඟරා පුවත්පත් මෙම අංශය තුල සංරක්ෂණය කළ යුතුය.

(ආ) පුස්තකාලයාධිපතිගේ ලිඛිත අවසරය ලබා පර්යේෂකයින්ට මෙම අංශය භාවිතා කල හැකිය.

(11) ආබාධිත ජනතාව සඳහා පුස්තකාල සේවා අංශය :

අන්ධභාවය නිසා ආබාධිත වූ පාඨකයා සඳහා මෙම අංශය පිහිටවිය යුතු අතර, බ්‍රේල් ක්‍රමයට සකස් කරනු ලැබූ පොත්පත් වාර සඟරා ලබා දීමට ඒ මඟින් කටයුතු කල යුතුය.

(12) ප්‍රජා තොරතුරු සේවා අංශය :

(අ) ඓතිහාසික, සමාජ ආර්ථික, වානිජමය, අධ්‍යාපනික හෝ වෙනත් තොරතුරු අවශ්‍ය වන පාඨකයින් සඳහා තොරතුරු සැපයීම ප්‍රජා තොරතුරු සේවා අංශය යටතේ සේවාවන් විය යුතුය.

(ආ) දඹුල්ල මහ නගර සභාවේ අතුරු ව්‍යවස්ථා, සභ වාර්ථා, ප්‍රගති වාර්ථා, අයවැය ලේඛන, අවසාන ගිණුම් විග්‍රහය හෝ දඹුල්ල මහ නගර සභාවට අදාල තොරතුරු හා වෙනත් තොරතුරු අවශ්‍යවන පාඨකයින් සඳහා සැපයීමට ප්‍රජා තොරතුරු අංශය පිහිටුවිය යුතුය.

(ඇ) දඹුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගේ හෝ පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ලබා ගන්නා ඕනෑම අයෙකුට ප්‍රජා තොරතුරු සේවා අංශය යටතේ තොරතුරු ලබා දීමට කටයුතු කළයුතුය.

(ඈ) මෙම අංශයට අදල යම් තොරතුරක් සම්බන්ධයෙන් පිටපතක් ඉල්ලා සිටින ඕනෑම අයෙකුට දඹුල්ල මහා නගර සභාවේ මහා සභාව විසින් නියම කරන ලද ඊට අදළ නියමිත ගාස්තුව ගෙවා පිටපතක් ලබා ගත හැකිය.

(13) ඡායා පිටපත් අංශය :

(අ) පුස්තකාලය පරිහරණය කරන පාඨකයින්ට යම් පොතක, වාර සඟරාවක, පුවත්පතක කොටසක ඡායා පිටපත අවශ්‍ය වූ විට ලබා ගැනීම සඳහා මෙම අංශය පිහිටුවිය හැකිය.

(ආ) දඹුල්ල මහා නගර සභාව විසින් නියම කරනු ලබන ගාස්තු ගෙවන පාඨකයෙකු හට පුස්තකාලයාධිපතිගේ අධීක්ෂණය යටතේ පිටපත් ලබා දිය හැකිය.

(ඇ) කිසියම් අවස්ථාවකදී පොතක, පුවත්පතක, වාර සඟරාවක කොටසක් පමණක් ඡායා පිටපත් ලබා දිය හැකි අතර සම්පූර්ණ පොතක් පුවත් පතක්, වාර සඟරාවක් නැවත ඡායා පිටපත් කර ලබා නොදිය යුතුය.

29. (ඇ) ප්‍රධාන පුස්තකාලයට පරිහාරිව මහා නගර සභා බල ප්‍රදේශය තුළ වසම් මට්ටමින් කියවීම් ශාලා පවත්වාගෙන යනු ලැබිය හැකිය

(ඈ) කියවීම් ශාලා වෙතින් පුවත්පත් හා වාර සඟරා පමණක් පාඨකයන්ට කියවීම සඳහා ලබා ගත හැකිය.

34. (2) දඹුල්ල මහජන පුස්තකාලයට අයත් කිසිදු අංශයකට බීමතින් පැමිණීම, පුස්තකාලය විවෘතව පවතින කාලය තුල දී එම පරිශ්‍රය තුල මත්පැන් බීම, බුලත්විට හැපීම, සූදු ක්‍රීඩාවක යෙදීම, එකිනෙකා අතර සාකච්ඡා කිරීම, නිකරුනේ ගැවසීම, පුස්තකාලයේ සාමාජිකයින්ට හා නිලධාරීන්ට බාධාවන ලෙස හැසිරීම, නිදා ගැනීම, ආහාර ගැනීම, සිඟමන් ඉල්ලීම, ආධාර එකතු කිරීම, දේශන පැවැත්වීම, කිසියම් සතෙකු ගෙන ඒම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

(3) දඹුල්ල මහජන පුස්තකාලය වසා තබන කාලය තුළ එම පරිශ්‍රය තුල රැඳී නොසිටිය යුතු අතර දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාගේ හෝ පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ලබා ඇති සේවකයෙකු හැර කිසිම අයෙකු පුස්තකාලයෙහි සේවාවන් අවසන් වීමෙන් පසු පුස්තකාලයේ රැඳී නොසිටිය යුතුය.

(10) පුස්තකාල සාමාජිකයෙකු බැහැරින් රැගෙන එන සියලුම භාණ්ඩ දොරටුව අසල පිළිගැනීමේ කවුන්ටරයකට භාර දී ටෝකන් පත්‍රයක් ලබාගත යුතුය. එකී භාණ්ඩ එම දිනයේ දීම පාඨකයා විසින් ඉවත්කර ගත යුතු අතර, එම දිනයෙන් පසුව එම භාණ්ඩ පිළිබඳව කිසිඳු වගකීමක් නැත. ටෝකන් පත්‍රය අස්ථාන ගත වූ අවස්ථාවේ දී භාණ්ඩ වල අයිතිය සනාත කල පසු ආපසු භාරදීමට කටයුතු කල හැකිය. නැති වූ ටෝකන් පත්‍රය වෙනුවෙන් දඹුල්ල මහා නගර සභාව වැය කල මුදල පාඨකයා ගෙවිය යුතුය. භාණ්ඩ භාර දීමට පෙර ආරක්ෂාව සඳහා ගනු ලබන පියවර ලෙස පරීක්ෂා කර බැලීමට නිලධාරීන්ට බලය හිමිවනු අතර, භාණ්ඩ ආපසු නිකුත් කළ පසු සිදුවන අඩුපාඩු පිළිබඳව වග කියනු නොලැබේ. පරීක්ෂා කිරීමට විරුද්ධ වන භාණ්ඩ කවුන්ටරයට භාර ගැනීම නොකළ යුතුය. වටිනාකමින් අධික භාණ්ඩ හෝ මුදල් කවුන්ටරයට භාර දීමෙන් වැලකීමට සෑම පාඨකයෙකම වගබලා ගත යුතුය.

35. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර දඹුල්ල මහා නගර සභා සීමාව තුල නිසි බලය ඇති අධිකරණයක් මඟින් එම වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසු හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් හෝ බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් හෝ පොලිස් අධිකාරි විසින් බලය පවරනු ලැබූ පොලිස් නිලධාරියෙක් විසින් හෝ ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලි න් 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 276 (3) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩණයේ උපරිමය විය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙහිලා අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

"සභාව" යන්නෙන් දඹුල්ල මහා නගර සභාව ද,

"නගරාධිපති" යන්නෙන් තත්කාලයෙහි දඹුල්ල මහා නගර සභාවේ නගරාධිපතිවරයා ද,

"නාගරික කොමසාරිස්" යන්නෙන් දඹුල්ල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ද,

"ප්‍රධාන පුස්තකාලය" යන්නෙන් මහ නගර සභා භූමිය තුළ පිහිටා ඇති මහජන පුස්තකාලය ද,

"කමිටු" ව යන්නෙන් පුස්තකාල උපදේශක කමිටුව ද,

"පුස්තකාලයාධිපති" යනු පුස්තකාලය භාරව කටයුතු කිරීමට පත් කරන තැනැත්තා ද,

"පුස්තකාල සහායක" යන පාඨයෙන් පුස්තකාලයාධිපතිගේ සහයකයෙකු ද අදහස් වේ.

04 - 735

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

### මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීම

### බිංගිරිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධාන වලට අනුකූල වන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය කිරීමට නියමිත බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය සහ 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත්කරමි.

ඒ. ඒ. ජයසිරි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2019 මාර්තු මස 25 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය I

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය**

| | සටහන් | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම :** | | | |
| රජයේ දයකය - පුනරාවර්තන | 01 | 49,363,518.70 | 43,230,335.17 |
| ආදායම | 02 | 58,385,861.98 | 48,568,808.83 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **107,749,380.68** | **91,799,154.00** |
| | | | |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| පුනරාවර්තන වියදම් | 03 | 78,612,184.26 | 78,341,538.39 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **78,612,184.26** | **78,341,538.39** |
| **වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය** | | **29,137,196.42** | **13,457,615.61** |
| | | | |
| ප්‍රාග්ධන ලැබීම් | 04 | 27,802,117.05 | 26,698,981.76 |
| ප්‍රාග්ධන වියදම් | 05 | 42,713,438.19 | 57,699,503.00 |
| **වර්ෂය සඳහා අතිරික්තය/ ඌනතාවය** | | **14,225,875.28** | **(17,542,905.63)** |

**බිංගිරිය ප්‍රදේශීය සභාව**

**2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | සටහන් | 2018.12.31 | 2017.12.31 |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 06 | 273,062,534.82 | 249,841,087.95 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 07 | 2,390,844.99 | 1,981,105.76 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 10,712,598.57 | 11,334,520.44 |
| ලැබිය යුතු දෑ | 09 | 53,766,832.93 | 73,020,401.04 |
| ආයෝජන | 10 | 44,582.28 | 42,980.37 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 13,567,796.62 | 21,971,544.64 |
| | | 80,482,655.39 | 108,350,552.25 |
| **මුළු වත්කම්** | | 353,545,190.21 | 358,191,640.20 |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 5,839,189.79 | - |
| ජංගම වගකීම් | 13 | 35,994,480.11 | 69,272,759.84 |
| හිමිකම් | 14 | 311,711,520.31 | 288,918,220.36 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 353,545,190.21 | 358,191,640.20 |

04-714

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.